# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1922/49 - 2015 ජූලි මස 10 වැනි සිකුරාදා - 2015.07.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1912 අංක 07 දරන ප්‍රසිද්ධ රඟුම් පාලක පනත**

1969 අංක 11 දරන පනතින් සංශෝධනය වූ 1912 අංක 07 දරන රඟුම් පාලක පනතේ 3 වැනි සහ 6(10) වැනි වගන්ති ප්‍රකාරව සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන නියෝග.

රනිල් වික්‍රමසිංහ,
ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ සහ
සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2015 ජූලි මස 06 වැනි දින,
කොළඹ,
ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ දී ය.

**නියෝග**

01. මෙම නියෝග ''රඟුම් පාලක පනතේ බලපත්‍ර ගාස්තු අයකිරීමේ 2015 අංක 1 දරන නියෝග'' යනුවෙන් හඳුන්වන අතර එය 2015 ජූලි මස 15 දින සිට බලාත්මක වේ. 2009 ජූනි මස 15 වන දින අංක 1606/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2009 අංක 1 දරන නියෝග මෙයින් අවලංගු කෙරේ.

02. ශ්‍රී ලංකාව තුළ රඟුම් පාලක පනත යටතේ මහජන ප්‍රදර්ශනයක් සඳහා නීත්‍යානුකූල බලපත්‍රය සඳහා අයදුම් කරන සෑම පුද්ගලයෙකුම/ආයතනයක්ම එකී අයදුම් පත්‍රය සමග පහත සඳහන් පරිදි බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු ය :-

*(අ) චිත්‍රපට*

| | | |
|---|---|---|
| (i) | විදේශීය චිත්‍රපට සඳහා (පූර්ව ප්‍රචාරක පටය ද ඇතුළත්ව) | - රුපියල් 20,000.00 |
| (ii) | දේශීය චිත්‍රපට සඳහා (පූර්ව ප්‍රචාරක පටය ද ඇතුළත්ව) | - රුපියල් 10,000.00 |
| (iii) | පූර්ව ප්‍රචාරක පටය පමණක් ඉදිරිපත් කරන අවස්ථාවලදී | - රුපියල් 1,000.00 |
| (iv) | සීමිත ප්‍රදර්ශනය සඳහා වන ඩීවීඩී/බ්ලූ රේ චිත්‍රපට සඳහා | - රුපියල් 1,000.00 |

(අ. 1) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම් පත මණ්ඩලය වෙත බාර දීමෙන් අනතුරුව, වැඩ කරන දින 5ක් ඇතුළත බලපත්‍රය නිකුත් කරන අතර, හදිසි අවශ්‍යතා මත කෙටි කාලයක දී බලපත්‍රය අවශ්‍ය වේ නම් පහත දැක්වෙන පරිදි අමතර ගාස්තුවක් ගෙවිය යුතු වේ :-

(i) පැය 24ක් ඇතුළත ලබා ගැනීම සඳහා නියමිත ගාස්තුවෙන් සියයට පනහක අමතර ගෙවීමක්.

1A - G 21879 — 15 (2015/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ii) එක් දින සේවය සඳහා නියමිත ගාස්තුවෙන් සියයට සියයක අමතර ගෙවීමක්. (එක් දින සේවාව සඳහා වැඩ කරන දිනවල පෙරවරු 9.30ට කලින් අයදුම්පත් බාර දිය යුතු ය.),

(iii) පාලක මණ්ඩලය ශාලාවේ තිරගත කිරීමේ පහසුකම් නොමැති අවස්ථාවල, අදාළ දිනයන්ට අනුගත වන සේ මණ්ඩලය වෙනුවෙන් තිරගත කිරීමේ වගකීම අයදුම්කරු විසින් දැරිය යුතු ය,

(iv) පැය 48කට පෙරාතුව මණ්ඩලය වෙත දැන්වීමෙන්, තිරගත කිරීම සඳහා නියම කරගත් දිනය වෙනස් කරලීමේ හැකියාව අයදුම්කරු සතු ය. එහෙත්, ඊට අඩු කාලයක දී හෝ මුල් වෙනස් කිරීමෙන් පසුව නැවත වෙනසක් සිදු කරන්නේ නම් හෝ එසේ වෙනස් කරන එක් එක් වාරයක් පාසා රුපියල් 5,000.00 ක අමතර ගාස්තුවක් ගෙවිය යුතු ය.

(ආ) වේදිකා නාට්‍ය

(i) දීර්ඝ වේදිකා නාට්‍යයක් සඳහා - රුපියල් 1,000.00

(ii) කෙටි වේදිකා නාට්‍යයක් සඳහා - රුපියල් 500.00

(ආ. 1) වේදිකා නාට්‍ය පිටපත් අනුමැතිය සඳහා අයදුම් පත් මහජන ප්‍රදර්ශනයට දින 21කට පෙරාතුව මණ්ඩලය වෙත බාරදිය යුතු ය. ඉන්පසු බාර දෙන නාට්‍ය පිටපත් සඳහා නියමිත ගාස්තුවෙන් සියයට සියයක අමතර ගාස්තුවක් අය කෙරේ.

(ඇ) සංගීත හා ප්‍රාසාංගික සංදර්ශන

(i) දේශීය කලාකරුවන් සහභාගී වන එළිමහන් සංදර්ශනයක් සඳහා - රුපියල් 2,500.00

(ii) දේශීය කලාකරුවන් සහභාගී වන ශාලාවක් තුළ සංදර්ශනයක් සඳහා - රුපියල් 2,000.00

(iii) විදේශීය කලාකරුවන් සහභාගී වන එළිමහන් සංදර්ශනයක් සඳහා - රුපියල් 25,000.00

(iv) විදේශීය කලාකරුවන් සහභාගී වන ශාලාවක් තුළ සංදර්ශනයක් සඳහා - රුපියල් 15,000.00

(v) රූපවාහිනී නාලිකා මගින් සෘජුව සංවිධානය කරන සංගීත හා ප්‍රාසාංගික සංදර්ශන සඳහා - රුපියල් 25,000.00

(ඇ.1) සංගීත හා ප්‍රාසාංගික සංදර්ශන සඳහා අයදුම් පත් මහජන ප්‍රදර්ශනයට දින 10කට පෙරාතුව මණ්ඩලය වෙත බාරදිය යුතු ය. ඉන්පසු බාර දෙන අයදුම් පත් සඳහා නියමිත ගාස්තුවෙන් සියයට විසිපහක අමතර ගාස්තුවක් අය කෙරේ.

03. යම් සාමාජයීය, අධ්‍යාපනික, සංස්කෘතික හා ආගමික වැදගත් කමකින් යුතු කුමන ආකාරයක හෝ සංදර්ශන සඳහා බලපත්‍ර, මණ්ඩලයේ අභිමතය පරිදි අදාළ ගාස්තුවෙන් නිදහස් කළ හැකි ය. ගාස්තුවෙන් නිදහස් කිරීම සඳහා කෙරෙන ඉල්ලීම් මහජන ප්‍රදර්ශනය පැවැත්වීමට දින 14කට පෙරාතුව මණ්ඩලය වෙත ලිඛිතව ඉල්ලුම් කළ යුතු ය.

04. අස්ථානගත වූ බලපත්‍රයක් වෙනුවෙන් යළි බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා රුපියල් 1,000.00 ක ගාස්තුවක් ගෙවිය යුතු වේ.

07-1228

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.